**සමාගම් අරමුදල - 2017**

**--------------------------**

සමාගම් අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 479 (6) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගම් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගම් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සමාගම් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතයවේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

--------------------------------------------------

(i) ආයතනයේ ප්‍රතිපත්තිය උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම වුවද, භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම හා වාර්ෂික වාර්තා ගොනුකිරීම තුළින් උපයන ආදායම මුදල් පදනම් මත ගිණුම් තබා තිබුණි.

(ii) භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත ලබා දී තිබුණු රු 1,700,000,000 න් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.416,939,230 ක මුදලක් හිලව් කරගෙන තිබූ අතර ඉතිරි මුදල වූ රු.1,283,060,770 ක් ජංගම නොවන වත්කමක් ලෙස ගිණුම් ගත කරනු වෙනුවට, අත්තිකාරම් වශයෙන් ජංගම වත්කම් තුල ගිණුම් ගත කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

-----------------------------------------------

(i) වර්ෂයේ අතිරික්තය රු. 572,934,730 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේදී මෙහෙයුම් අතිරික්තය ලෙස රු.573,305,228 ක් යොදා ගැනීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ගලා ඒම් රු.370,498 කින් වැඩියෙන් දැක්වුණි.

(ii) පෙර වර්ෂ වෙනුවෙන් කරන ලද ගෙවීම් රු. 523,000 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයට ගලපා තිබූ අතර කාරක ප්‍රාග්ධනය වෙනස්වීම යටතේ උපචිත වියදම් වෙනස්වීම රු.161,202 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට රු.24,529,385 ක් වූ ලැබිය යුතු භාණ්ඩාගාර බැඳුම් කර පොලී ආදායම ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් අතිරික්තය සහ ලැබිය යුතු පොලී ආදායම යන දෙකම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) විගණනයේ ගණනය කිරීම් අනුව සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි සමුච්චිත ක්ෂය වටිනාකම රු. 1,086,156 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2017 වර්ෂයේදී නව පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත් සමාගමක් වෙත ලබාදුන් රු. 1,520,000 ක් වන පළමුවන වාරික මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කෙරීගෙන යන වැඩ යටතේ දැක්වීම වෙනුවට දේපළ , පිරියත හා උපකරණ ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඈ) දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ඔවුන් සතු මරදාන , ඩී. ආර්. විජේවර්ධන මාවතෙහි දැනට සමාගම් මැදුර ගොඩනැගිල්ල පිහිටි හෙක්ටයාර 0.1408 ක ඉඩම සමාගම් රෙජිස්ට්‍රාර් වෙත 2015 අගෝස්තු 13 වන දින පවරා දී තිබූ නමුත් එම ඉඩමේ වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඉ) ඉකුත් වසරේ උපචිත වියදම් රු. 336,555 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබීමේ වරද, නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වසරේදී රු. 523,000 ක් සමුච්චිත අරමුදල් ගිණුමට හර කර වෙනත් වියදම් ගිණුමට බැර කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදල් හා වෙනත් වියදම් යන ගිණුම් දෙකම රු. 186,445 කින් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි.

(ඊ) අසාර්ථක වීම නිසා අතරමග නවතා දමන ලද පරිගණක පද්ධතිය වෙනුවෙන් වැයකර තිබූ රු. 13,268,449 ක් 2014 වර්ෂයේදී කෙරීගෙන යන වැඩ යටතේ දක්වනු වෙනුවට අදාල වත්කම් ගිණුමේ ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.6,927,900ක ක්ෂය ගිණුම්ගත කර තිබුණි.

(උ) ඉදිරි වර්ෂයේදී උපලබ්ධි වීමට නියමිත රු.262,681,731 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර බිල්පත් විකිණීමෙන් ලද අතිරික්තය භාණ්ඩාගාර බැඳුම්කර කල්පිරීමේදී උපලබ්ධි වන ප්‍රාග්ධන ලාභය වන රු.83,730,684 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුළ භාණ්ඩාගාර පොලී ආදායමෙන් වෙන්කර දක්වා නොතිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 උපවගන්තිය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අතිරේක 13 ප්‍රකාරව රු.මිලියන 57 ක් වූ මෘදුකාංග සම්පාදනය කිරීමේ කොන්ත්‍රාතුව පිරිනැමීමේ හා 2017 වර්ෂය වෙනුවෙන් ආරක්ෂණ සේවාව සඳහා සුදුසුකම් ලත් කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම යන ප්‍රසම්පාදනයන්හි ද ලංසුකරු පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි වීමේ අවශ්‍යතාවය දක්වා නොතිබුණි.

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2016 වසරේ අයවැය යෝජනාවක් අනුව සති අන්තයේදී මහජන සේවාවන් සඳහා කාර්යාලය විවෘත කර තැබීම වෙනුවෙන් දිරිදීමනාවක් ගෙවීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ROC/HC/15 හා 2016 ඔක්තෝබර් 19 දින ලිපියෙන් අමාත්‍යාංශ ලේකම් මගින් මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත අනුමැතියට යවා තිබුණි. 2016 ඔක්තෝබර් 28 දිනැති අංක DMS/1122 දරන ලිපියෙන් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් මේ සම්බන්ධව ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරි කටයුතු සඳහා යොමු කර තිබුණි. නමුත් ඒ සම්බන්ධව මේ දක්වාම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හෝ ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් කිසිදු පිළිතුරක් එවා නොතිබුණු අතර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත දිරි දීමනා ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂය තුල රු. 9,938,140 ක මුදලක් අරමුදලින් වැය කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 572,934,730 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 408,130,934 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 164,803,796 කින් වර්ධනය වී තිබූ අතර එම වැඩිවීමට භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර පොළිය රු. 103, 962,700 කින් වැඩිවීම ප්‍රධාන ලෙස හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මූල්‍ය අතිරික්තයේ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේ දී ආයතනයේ දායකත්වය 2013 වර්ෂයේ රු. 356,763,319 සිට 2017 වර්ෂයේදී රු. 596,350,650 දක්වා වර්ධනය වී තිබුණි.

### 3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

ආයතනයෙන් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව බාහිර පාර්ශවයන් විසින් සමාගම් රෙජිස්ට්‍රාර්ට එරෙහිවත් සමාගම් රෙජිස්ට්‍රාර් විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිවත් නඩු පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා සමාගම් ලියාපදිංචිය, සමාගම් වාර්ෂික වාර්තා ලියාපදිංචිය, සහ සමාගම් මූල්‍ය වාර්තා ලියාපදිංචිය ඇතුළු අනෙකුත් කටයුතු වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඉකුත් වර්ෂය සමග සසඳා පහත දැක්වේ.

| කාර්යය | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය (රු.) | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| සමාගම් වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීම | 34,593 | 36,955 | 207,375,000 | 184,608,500 |
| මූල්‍ය වාර්තා ලියාපදිංචි කිරීම | 2,215 | 2,162 | 4,428,000 | 2,162,000 |
| නව සමාගම් ලියාපදිංචිය | 9,782 | 8,218 | 47,796,000 | 127,005,000 |
| සමාගම් ලේකම්වරුන් ලියාපදිංචිය | 817 | 701 | 4,285,000 | 1,815,000 |
| සහතික කල පිටපත් නිකුත් කිරීම | 57,400 | 57,556 | 58,373,964 | 29,536,300 |
| සමාගම් ගොනු පරීක්ෂා කිරීම | 10,580 | 12,674 | 10,580,070 | 6,337,040 |

(i) අංක 1990/12 හා 2016 ඔක්තෝබර් 25 දින පළකරන ලද ගැසට් නිවේදනය මගින් සමාගම් (ගාස්තු) සංශෝධනය කර තිබුණි. ඒ අනුව 2017 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ගාස්තු සංශෝධනයක් සිදු කර තිබුණු අතර ඒ හේතුවෙන් මෙම වසරේ ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව වැඩි වී තිබුණි. ගාස්තු වැඩිවීම ආදායම ඉහල යාමට හේතුවී තිබුණි.

(ii) 2017 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගාස්තු සංශෝධනය වී තිබියදී ඒ බව නොතකා ජනවාරි හා පෙබරවාරි මාසයන්හි දීත් 2016 වර්ෂයේ දී පැවති ගාස්තු මත පදනම්ව අයකිරීම සිදු කිරීම නිසා අවස්ථා 87 ක වාර්ෂික වාර්තා ඉදිරිපත් කරන ලද සමාගම් ගාස්තු රු.87,000 කින් ද, අවස්ථා 210 ක දී සෘණභාරය පිළිබඳ සහතික නිකුත් කිරීමේ ගාස්තු රු.519,000 කින් ද අඩුවෙන් අයකර තිබුණි.


(iii) 2007 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ලියාපදිංචි කර තිබුණු මුළු සමාගම් සංඛ්‍යාව 72,865 ක් වූ අතර , සංස්ථාපනයෙන් පසු වාර්ෂික වාර්තා ගොනු කළ යුතු කාල සීමාව තුල කිසිදු වාර්ෂික වාර්තාවක් ගොනු නොකරන ලද සමාගම් සංඛ්‍යාව 16,148 ක් විය. නැවත ලියාපදිංචි කරන ලද සමාගම් 25,071 ක් අතුරින් සමාගම් 2,555 ක් නියමිත කාල සීමාව තුල වාර්ෂික වාර්තා ගොනු කර නොතිබුණි.

සමාගම් 3,485 ක නම් කපා හැර තිබුණු අතර එයින් සමාගම් 2,715 ක නාමය කපා හැර තිබුණේ වාර්ෂික වාර්තා ගොනු නොකිරීමේ හේතුව නිසාවෙනි. ඒ අනුව, නාමය කපා හැරීම නිසා අරමුදලට අහිමි වූ ආදායම රු.33,911,333 ක් විය.

(iv) මුදල් රෙගුලාසි 128 (2) (ඉ) සහ 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04 (අ) සහ (ආ) ඡේද අනුව ගණන් දීමේ නිලධාරියා කටයුතු කර නොතිබුණි. 2007 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදලට ලැබිය යුතු රු 1,082,420,000 ක හිඟ ආදායම් ශේෂයෙන් වසර 3 ට වැඩි රු.507,008,000 ක්ද වසර 3 ට අඩු රු.575,412,000 ක්ද ඇතුළත්ව තිබුණු අතර මෙම හිඟ ශේෂ අයකර ගැනීමේ විධිමත් වැඩපිළිවෙලක් අරමුදලට නොතිබුණි.

(v) සමාගම් පනතේ 170 (1) වගන්තියේ නියමය පරිදි 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා ලියාපදිංචි කළ යුතු සමාගම් සංඛ්‍යාව 7,468 ක් වුවද සත්‍ය වශයෙන් ලියාපදිංචි කළ සමාගම් සංඛ්‍යාව 2,215 ක් පමණක් විය. එහෙත් පනත ප්‍රකාරව මූල්‍ය වාර්තා ලියාපදිංචි කළ යුතු සමාගම් හඳුනාගෙන එම වාර්තා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරවීමට අදාළ වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව සතු නොවිය.

(vi) වාර්ෂික වාර්තා ගොනු කිරීම පැහැර හැර තිබුණු සමාගම් සංඛ්‍යාව වාර්ෂිකව වර්ධනය වී තිබුණු අතර ඒ පිළිබඳ තොරතුරු පහත සඳහන් වේ.




(ආ) සමාගම් පනතට අනුකූලව සීමිත සමාගම් ලියාපදිංචි කිරීම සහ එමඟින් නියම කර ඇති විධි විධානවලට අනුකූලව ලියාපදිංචි සමාගම්වල කටයුතු මෙහෙයවීම සහ ඒ අනුව ක්‍රියාකරන බවට වග බලා ගැනීමත්, එසේ ක්‍රියා නොකරන අවස්ථාවලදී සමාගම් පනතෙන් නියම කර ඇති බලතල අනුව ක්‍රියාකර ලියාපදිංචි සමාගම්වල කටයුතු සමාගම් පනතේ නියම කර ඇති විධිවිධානවලට අනුකූලව පවත්වා ගෙන යාමට කටයුතු කරවීම සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ට සමාගම් පනතෙන් පැවරී ඇති ව්‍යවස්ථාපිත කාර්යයක් වුවත්, සමාගම්වල කටයුතු නියාමනය සඳහා වූ ක්‍රියාකාරී වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පවිත්‍රතා සේවය සඳහා 2017 අප්‍රේල් 01 සිට 2017 දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව අධීක්ෂන නිලධාරීන්, කම්කරුවන් හා වෙනත්, යන කාණ්ඩ වල එකඟ වූ සේවක සංඛ්‍යාව සේවයේ යෙදවීමට කොන්ත්‍රාත් සමාගම අපොහොසත්ව තිබුණු අතර ඇතැම් මාස වල සේවයේ නොයෙදවූ මිනිස් දින ගණන 11 සිට 61 දක්වා පුළුල් පරාසයක විහිදී තිබුණි.

(ආ) 2015/2016 වසර සඳහා වූ ආරක්ෂක සේවා ගිවිසුම 2016 ජූලි 31 දින අවසන් වීමට නියමිතව තිබිය දී 2018 පෙබරවාරි 28 දින දක්වාම අවස්ථා කිහිපයක දී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර කරමින් පවත්වාගෙන ගොස් තිබූ අතර විගණිත දිනය වූ 2018 ජුනි 30 දින වන විටත් ගිවිසුම් කාලය දීර්ඝ කිරීමක් හෝ නව ගිවිසුමකට එළැඹීමක් සිදුනොකොට ගිවිසුම් රහිතව එම සේවාව සැපයීමට අදාල කොන්ත්‍රාත්කාර සමාගමට ඉඩ දී තිබුණි.

(ඇ) අරමුදලේ කටයුතු ක්‍රමවත්ව පවත්වා ගෙන යාමට අවශ්‍ය පරිගණක පද්ධතියක් 2017 දෙසැම්බර් 31 දින වන විට ස්ථාපිත කිරීමට අපොහොසත් වී තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබූ නමුත් වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්වීම මත සිය විෂය පථයට අනුව ළගා කර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන නොතිබුණි.

### 5.2 නොවිසඳී ඇති විගණන ඡේද

2016 වසරේ විගණකාධිපති වාර්තාවේ දක්වා තිබුණු පහත සඳහන් කරුණු වලට අදාලව කටයුතු කර නොතිබුණි.

| | වාර්තාවේ ඡේදයට යොමුව | විගණන නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | 4.3 ඡේදය | සමාගම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පරිගණක ගත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ රු. 88,812,207 ක කොන්ත්‍රාතුවක් 2014 ජනවාරි 24 දින කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනමා තිබුණි. නියමිත ගිවිසුම් කාලය තුල කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට අපොහොසත්වීම මත ගිවිසුම අවසන් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණු අතර ව්‍යාපෘතිය අතරමග නතර කර දමා තිබුණි. ඒ වන විට කොන්ත්‍රාත්කරු වෙත සමාගම් අරමුදලින් රු.13,268,449 ක් ගෙවා තිබුණි.<br><br>සමාලෝචිත වර්ෂය වන විට වෙළඳ පොළ වටිනාකමක් නොමැති 2006 වර්ෂයේ රු. 90,275,000 කට මිලදී ගන්නා ලද රු.10 යේ වරණීය කොටස් 3,000,000 ක හා රු.10 යේ සාමාන්‍ය කොටස් 6,275,000 ක මිලදී ගැනුම් වටිනාකම ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි. |
| (ආ) | 4.4 ඡේදය | 2007 අංක 07 දරන සමාගම් පනතේ කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීමේදී සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් දරනු ලබන සියලුම වියදම් අරමුදලින් දැරිය හැකි වුවත්, සමාගම් පනතේ 4 වන වගන්තිය යටතේ අනුමත වියදම් යටතට නොගැනෙන, පාඩු ලබමින් තිබූ සීමිත සමාගමකට අයත් කොටස් මිලදී ගැනීම සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ ඉල්ලීම පරිදි 2006 වර්ෂයේදී රු. 90,275,000 ක් වැයකර තිබුණි. 2017 ජුනි 30 දින දක්වා මෙම ආයෝජනයෙන් කිසිදු ප්‍රතිලාභයක් සමාගම් අරමුදලට ලැබී නොතිබුණු අතර අදාල සමාගම බුන්වත්වීම නිසා එය ඈවර කිරීමට තීරණය කර තිබුණි. එබැවින් ඉහත ආයෝජිත මුදලට අදාල අයිතිවාසිකම් හෝ ආයෝජිත මුදල් නැවත සමාගම් අරමුදලට ලබාගැනීම අවිනිශ්චිතව පවතී. |

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණක ඇතුළු නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2017 වර්ෂය තුළ විගණන විමසුම් 03 ක් පමණක් නිකුත් කර තිබුණද අභ්‍යන්තර විගණන අංශයේ විගණන සැලැස්ම ප්‍රකාරව අපේක්ෂිත විෂය ක්ෂේත්‍රය ආවරණය වී නොතිබුණි.

### 6.2 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.2.1 ප්‍රසම්පාදනයන්

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සහ උපදේශන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 57 ක් වැයකර පරිගණක මෘදුකාංග මිලදී ගැනීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) උපදේශන ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුවට පත් කරනු ලැබූ සියලු සාමාජිකයින් සහ සියලුම ප්‍රසම්පාදන කමිටු සහායක සේවා නිලධාරීන්ද උපදේශන සේවා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතෙහි 2.8 ඡේදයේ සඳහන් ආකෘති ප්‍රකාරව එම පත් කිරීම් සම්බන්ධව කැමැත්ත පල කරමින් ප්‍රකාශයක්, ඉදිරිපත් කර නොතිබුණ අතර උපදේශන සේවා මාර්ගෝපදේශ සංග්‍රහයේ හා මාර්ගෝපදේශ අත්පොතෙහි 5.1.ඡේදයෙහි සඳහන් කාල රාමුව ඉක්මවා සති 64 ක් මෙම ප්‍රසම්පාදනය සඳහා ගත කර තිබුණි.

(ii) මෙම ප්‍රසම්පාදනයේ දී අභිලාශය ප්‍රකාශ කරන ලද තැනැත්තන් අතුරින් 07 දෙනෙකු තෝරා ගෙන ඔවුන්ගෙන් තාක්ෂණික හා මූල්‍ය යෝජනාවලි ගෙන්වා ගෙන, ඇගයීම් කිරීමෙන් පසු අවම ලකුණු සීමාව වූ 70 ඉක්මවා සුදුසුකම් සපුරන ලද එක් ලංසු කරුවෙකු සිටිය දී ඔහුගේ මූල්‍ය යෝජනාවලිය විවෘත කිරීමකින් තොරව නැවත වරක් එම ලංසුකරුවන් හත්දෙනාගෙන්ම තාක්ෂණික හා මූල්‍ය යෝජනාවලි ගෙන්වා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි.

(iii) ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් විසින්, සුදුසුකම් ලබන අවම ලකුණු සීමාව අඩු කිරීමටත් , ලකුණු ව්‍යුහය වෙනස් කිරීමටත්, "ඉදිරිපත් කිරීමක්" සඳහා ලකුණු ලබා දීමත් ඇතුළත්ව නැවතත් යෝජනාවලින් කැඳවීමට තීරණය කර 2016 ජූලි 01 දිනැතිව ජාතික ප්‍රසම්පාදන කොමිසමේ ලේකම්ගේ උපදෙස් ඉල්ලා තිබුණි. ජාතික ප්‍රසම්පාදන කොමිසමේ ලේකම්ගේ 2016 ජූලි 04 හා NPC/Function/2016/01 දිනැති පිළිතුරු ලිපියෙන් කමිටුව අපේක්ෂිත ආකාරයට කටයුතු කල නොහැකි බවත් මුල් අවස්ථාවේ තීරණය කරන ලද ලකුණු ප්‍රමාණය සැලකිල්ලට නොගෙන නැවත ආරාධනා කිරීම හෝ අතිරේක ලකුණු දීමක් කල නොහැකි බව එම ලිපියෙන් දක්වා තිබුණි. එහෙත් මෙම උපදෙස් බැහැර කර නැවතත් යෝජනාවලි කැඳවීමට උපදේශන ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි.

(iv) ඒ අනුව දෙවන වර යෝජනාවලිය කැඳවීමේ දී අවම ලකුණු සීමාව 70 සිට 60 දක්වා අඩුකර තිබුණි. key professional නිර්නායකය සඳහා දෙන ලද ලකුණු ප්‍රමාණය 50 සිට 25 දක්වා අඩුකර තිබුණු අතර ඉදිරිපත් කිරීම (Presentation) සඳහා ලකුණු 15 ක් ලබා දී තිබුණි.

(v)

(vi) තාක්ෂණික ඇගයීම් කමිටුව දෙවන වරට ලබාගත් තාක්ෂණික යෝජනාවලි ඇගයීම් කොට සාර්ථක ලංසුකරු ලෙස තෝරා ගැනීමෙන් අනතුරුව මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.4.3 මාර්ගෝපදේශය ප්‍රකාරව අවම වශයෙන් දින 5 කට පසුව හෝ ප්‍රමාණවත් කාලයක් ලබාදී ප්‍රසිද්ධියේ මූල්‍ය යෝජනාවලිය විවෘත කිරීම සිදුකළ යුතුය. එහෙත් ඊට පටහැනි ලෙස අවම කාලය ඉඩදීමකින් තොරව එදිනම මූල්‍ය යෝජනාවලිය ද විවෘත කර රු. මිලියන 57 ක ලංසුව ඉදිරිපත් කළ ලංසුකරු සාර්ථක ලංසුකරු ලෙස තෝරාගෙන තිබුණි. උපදේශන සේවා මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.2.1 (6) ඡේදය පරිදි හැකිතාක් ඉක්මණින් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කළ යුතු වුවත් කොන්ත්‍රාත් ගිවිසුමට එළඹීම සඳහා මාස 7 ක කාලයක් ගතකර තිබුණි.

(vii) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතට අනුව කොන්ත්‍රාත් ගිවිසුම ලියාපදිංචි කර ගැනීමට කටයුතු කළ යුතු වුවත් මෙම මෘදුකාංග ප්‍රසම්පාදන ව්‍යාපෘතිය සඳහා සුදුසුකම් ලත් උපදේශක සමාගම විසින් කොන්ත්‍රාත් ගිවිසුම ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබුණේ කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් මාස 06 ක් ගත වීමෙන් පසුවය.

**(ආ) ආරක්ෂක සේවා හා පවිත්‍රතා සේවා සැපයීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ආරක්ෂක හා පවිත්‍රතා සේවාවන්වල ඇස්තමේන්තුගත පිරිවැය පිළිවෙලින් රු.මිලියන 6 ක් හා රු .මිලියන 2 ක් ඊට අදාලව ප්‍රසම්පාදන සැලැස්ම තුලට ඇතුළත් කිරීමක් සිදුකර නොතිබුණි.

(ii) ආරක්ෂක හා පවිත්‍රතා සේවා ලබා ගැනීම සඳහා 2016 ජූලි 31 දින හා 2016 දෙසැම්බර් 14 දින පුවත්පත් දැන්වීමක් පළකර මිල ගණන් කැඳවා තිබුණද ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 14 ක් පමණක් ලබාදී තිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 ඡේදය ප්‍රකාර ලංසු සුරක්ෂණයක් ලබා ගැනීමට ලංසු කරුවන් දැනුවත් කර නොතිබුණි.

(iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 ඡේදය ප්‍රකාර කාර්ය සාධන සුරක්ෂණ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තත්‍ය අය විෂයයන් 03ක් සියයට 200 සිට සියයට 245 ක පරාසයකත් අයවැයගත හා තත්‍ය වැය විෂයයන්12ක් සියයට 10 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය එළදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණි.

## 07. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අවසන් ගිණුම් වලට අදාල ගිණුම් සටහන් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කර නොතිබීම. |
| (ආ) | හිඟ ආදායම් අයකර ගැනීම | වාර්ෂික වාර්තා ගාස්තු අයකර ගැනීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් ආයතනය තුළ ස්ථාපනය කර නොතිබීම. |
| (ඇ) | ප්‍රසම්පාදන කටයුතු | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූල වනසේ ඇගයීම් කමිටු ප්‍රසම්පාදන කමිටු , ප්‍රසම්පාදන සැලැස්ම නිසි පරිදි සකස් කර නොතිබීම. |
| (ඈ) | මෙහෙයුම් පාලනය | - ලියාපදිංචි කරන ලද සමාගම් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට විධිමත් වූ පරිගණක පද්ධතියක් ස්ථාපිත කර නොතිබීම.<br>- නියමිත පරිදි පනතේ සඳහන් කර ඇති කාලය තුලදී වාර්ෂික වාර්තා ගොනු කිරීම තුලින් බලාපොරොත්තු වන පරමාර්ථ ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබීම. |